# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශේෂ**

**අංක 2137/93- 2019 අගෝස්තු මස 23 වැනි සිකුරාදා - 2019.08.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය*: HAK/LAN/1/16.

*ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය*: 4-3/15/2016/VE/200.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:*

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ හක්මන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්දබඩ පත්තුව නැගෙනහිර සුළු කොට්ඨාසයේ අංක 284A, කැබිලියපොල දකුණ ගමේ පිහිටි, මාතර දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් මැන සකස් කර ඇති අවසාන ගම් පිඹුර 176 හි අතිරේක අංක 10 පත්‍ර අංක 9හි සඳහන් පහත විස්තර දැක්වෙන ඉඩම් කැබැල්ල.

01. **කැබලි අංක 273**

ඉඩමේ නම: ගොඩමබෙවෙල, බෝගහහේන; මුල් හිමිකම් පාන්නා: වෙලේ ගෙදර. කැබිලියපොල, දකුණ, හක්මන ලිපිනයේ පදිංචි කේ. එම්. සියදෝරිස්; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0114.

*මායිම්* :-

උතුරට: කැබලි අංක 113 සහ 89; නැගෙනහිරට: කැබලි අංක 89 සහ 113; දකුණට: කැබලි අංක 113; බටහිරට: කැබලි අංක 113 සහ 114;

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019 ඔක්තෝබර් මස 23 වැනි දින පූ. භා. 10.00ට හක්මන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2019 ඔක්තෝබර් 16 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩමට පරවශතාවය ලබා ගැනීම සම්බන්ධයෙන් වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරයත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

කුසලක නානායක්කාර,
ප්‍රාදේශීය ලේකම්,
හක්මන.

2019 අගෝස්තු මස 21 වැනි දින,
හක්මන, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09– 247


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A – G 30822– 17 (2019/08)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*